**ශීර්ෂය 176 - වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 176 - වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 22 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

### මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,227.82 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 214.52 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,013.30 ක් හෙවත් සියයට 90.37 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 216.54 | 205.81 | 10.73 | 4.96 |
| මූලධන | 2,011.28 | 8.71 | 2,002.57 | 99.57 |
| **එකතුව** | **2,227.82** | **214.52** | **2,013.30** | **90.37** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**---------------------**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**-------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**-------------------------------------------------**

අමාත්‍යාංශයට අදාල විෂයය අංක 17601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 6.00 | 5.89 | 2.90 | 5.02 | 20.00 | 14.31 |

**2.3 අග්‍රිම ගිණුම**

**------------**

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0115/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.10,051 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

**------------- --------**

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**---------------------------------------------**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**---------------------------------------------**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|---|
| (අ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ආ) | උප පත්‍රිකා ලේඛනය | මුදල් රෙගුලාසි 341 |

**3.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 2,000.62 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 23 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් රු.මිලියන 11.89 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 ක සිට සියයට 96 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**3.3 අග්‍රිම ගිණුම්**

2016 අප්‍රේල් 30 දින වන විට අමාත්‍යාංශය විසින් පියවා නොතිබුණු තත් කාර්ය අතුරු අග්‍රිමවල එකතුව රු.8,800ක් වී තිබුණි. වැඩ තහනමකට ලක්වූ නිලධාරියෙකු විසින් පියවිය යුතු එම ශේෂ වසර ගණනාවක සිට පැවැත එමින් තිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විෂයය අංක 17601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2016 ජුලි 18 දින වන විටත් අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 1.00 ක් වූ අතර, එම හිඟහිටි ශේෂයන්ගේ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 26 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට 2016 ජුලි 18 දින වන විටත් අපොහොසත් වී තිබුණි.

(ආ) රජයේ නිලධාරීන්ගේ ණය ශේෂ සම්බන්ධ පාලන ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂය හා භාණ්ඩාගාර පොත්වල එදිනට දැක්වෙන ශේෂය අතර රු. 80,823 ක නොසැසඳුනු ශේෂයක් පැවැතුණි.

**3.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

අමාත්‍යාංශයේ විෂයය පථය සංශෝධනය වීමෙන් අනතුරුව 2015 ජුලි 06 දින සිට අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණත්, එම ඒකකය සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක සමඟ තවත් එක් නිලධාරියෙකු පමණක් අනුයුක්ත කර තිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

අමාත්‍යාංශයට අයත් එකතුව රු.මිලියන 8.30 ක් වටිනා මෝටර් රථ 03ක් හා යතුරුපැදියක් වසරකට වැඩි කාලයක් මුළුල්ලේ නිෂ්ක්‍රීයව පරිශ්‍රයේ ගාල් කර තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් අනාවරණය වූ ඌනතා**

---

2015 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) හා (3) ප්‍රකාරව 2016 ජුලි 18 දින වන විටත් කටයුතු කර නොතිබුණි**.**

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

---

වෙනත් ආයතන සතුව ලියාපදිංචි හිමිකාරත්වය පැවති වාහන හතරක් විධිමත් පවරා ගැනීමකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතා කර තිබුණි.

**(ඈ) ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ හා යන්ත්‍ර හා උපකරණ අගය වෙනස් වීම් අනාවරණය නොවීම.**

---

ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා උපකරණ යන වත්කම් කාණ්ඩවල 2014 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂය හා 2015 ජනවාරි 01 දිනට පැවති ශේෂය අතර රු.මිලියන 2.01 ක වෙනසක් පැවතුණි.

**(ඉ) බේරුම් නොකළ බැරකම්**

---

2008 වර්ෂයේදී කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එළඹ තිබුණු ගිවිසුමකට අනුව මධ්‍යම රජය විසින් විදේශීය සමාගමකට ප්‍රතිපූරණය කළ යුතුව පැවති රු. මිලියන 48.97 ක් වූ බදු මුදලක් ගෙවීම සම්බන්ධව අසම්භාව්‍ය බැරකමක් පැවැතුණි.

**3.7 විදේශාධාර ව්‍යාපෘති**

---

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යාණය යටතේ ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු මිලියන 2,000ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට ප්‍රථම එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකි නිෂ්කාශයන් හා අනුකූලතාවයන් ලෝක උරුම සංරක්ෂණ වැඩපිළිවෙල යටතේ යුනෙස්කෝ ආයතනයෙන් ලබාගැනීමට අපොහොසත් වීම හේතුවෙන් ව්‍යාපෘති කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

**3.8 කාර්යසාධනය**

---

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

---

අමාත්‍යාංශයට අයත් විෂය පථය දැක්වෙන 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව පවරා තිබූ කාර්ය හා කර්තව්‍යයන්ගෙන් පහත

දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටුකර නොතිබුණි.

(i) බුන් යාත්‍රා හා සමුද්‍ර මුක්තාවශේෂ භාර ගැනීම, වෙරළාසන්න මඟී ප්‍රවාහන සේවා පවත්වා ගැනීම සම්බන්ධ කාර්යයන්

(ii) නාවික සංවර්ධන අරමුදලට අයවිය යුතුව පැවති රු.මිලියන 422.64 ක ණය අයකර ගැනීම හා පරිපාලන කටයුතු.

**(ආ) සැලැසුම් කිරීම**

**------------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව පහත සඳහන් කාර්යයන් ඉටු කර නොතිබුණි.

(i) අන්තර් ජාතික සමුද්‍රීය සංවිධානයේ සම්මුතියන් ප්‍රකාරව දේශීය නීති සම්පාදනය සඳහා වූ නීති කෙටුම්පත පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීමට සැලැසුම් කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය ඉටුකර නොතිබුණි.

(ii) වෙළඳ හා නාවික කටයුතු සඳහා අයකරනු ලබන ගාස්තු සංශෝධන කටයුතු සැලැසුම් කළ පරිදි 2015 ජුනි 30 දින අවසන් කළ යුතුව තිබුණද 2016 ජූනි 30 දිනය වන විටත් අවසන් කර නොතිබුණි.

(iii) 2015 ජුනි 30 දිනට ආරම්භ කළ යුතුව තිබූ අඛන්ඩ මුදාහැරීම් සහතික (CDC) සහ ප්‍රවීනතා සහතික (COC) මුද්‍රණ ක්‍රියාවලිය මූලික මට්ටමේ පැවතුණි.

(iv) ශ්‍රී ලාංකික නාවිකයන් සඳහා පිරිනමන සහතිකවල ජාත්‍යන්තර පිළිගැනීම සම්බන්ධයෙන් කොරියාව හා පෘතුගාලය සමග අවබෝධතා ගිවිසුම්වලට එළඹීමට සැලැසුම් කර තිබුණත්, ඉන් පෘතුගාලය සමග වූ අවබෝධතා ගිවිසුමට එළඹීමට 2016 ජූනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**--------------------------------**

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ හිටපු ව්‍යාපෘති අමාත්‍යවරයකුගේ ඉල්ලීම පරිදි නිකුත් කර තිබුණු ඇණවුමකට අනුව 2015 වර්ෂයේ සුභපැතුම් පත් 29,000ක් , ලිපි කවර හා ස්ටිකර් මුද්‍රණය කර 2014 නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී සැපයීම වෙනුවෙන් වූ රු.906,192ක බැරකමකට එළඹ තිබුණි. 2015 ජනවාරි 08 දින එලඹි අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි, අමාත්‍යාංශවල සුපුරුදු වියදම්වලින් පරිබාහිරව වැය කිරීමට අපේක්ෂිත වියදම් නතර කිරීම සඳහා උපදෙස් ලබාදී තිබුණි. එම උපදෙස් අනුව මෙම බිල්පත්වලට ගෙවීම අත්හිටුවීමට එරෙහිව සැපයුම්කරු නීතිමය ක්‍රියාමාර්ගවලට එළඹීම සඳහා එන්තරවාසියක් අමාත්‍යාංශය වෙත එවා තිබුණි.

**3.10 පාඩු හා හානි**

--------------

අමාත්‍යාංශයට අයත් ජීප් රථයකට සිදුවූ අලාභය වූ රු.481,550 ක් අදාළ පාර්ශවයන්ගෙන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 38 | 21 | 17 | - |
| (ii) | තෘතියික මට්ටම | 07 | 01 | 06 | - |
| (iii) | ද්විතියික මට්ටම | 86 | 55 | 32 | 01 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 54 | 23 | 31 | - |
| | **එකතුව** | **185** | **100** | **86** | **01** |